ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>DARPG ලේකම් වී. සිරිනිවාස් මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වේ</u>

ඉන්දීය රජයේ සේවක, මහජන දුක්ගැනවිලි සහ විශ්‍රාම වැටුප් අමාත්‍යාංශයේ පරිපාලන ප්‍රතිසංස්කරණ සහ මහජන දුක්ගැනවිලි දෙපාර්තමේන්තුවේ (DARPG) නියෝජිත පිරිසක් 2024 ජූලි 7-9 දිනවල තෙදින ශ්‍රී ලංකා සංචාරයක නිරත වූහ. මෙම ඉන්දීය නිල නියෝජිත පිරිසේ ප්‍රධානත්වය දැරුවේ DARPG ලේකම් සහ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයේ (NCGG) අධ්‍යක්ෂ ජෙනරාල් වී. ශ්‍රීනිවාස් මහතා විසිනි. DARPG ඒකාබද්ධ ලේකම් එන්. බී. එස්. රාජ්පුත්, NCGG ප්‍රධාන පරිපාලන නිලධාරිනි ප්‍රෙස්කා මැතිව්, NCGG මහාචාර්ය ආචාර්ය අෂුතෝෂ් පාල් සිං සහ NCGG පර්යේෂණ නිලධාරී ආචාර්ය මුකේෂ් භණ්ඩාරි යන මහත්ම මහත්මීන් ද නියෝජිත පිරිසට ඇතුළත් විය. ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා ඉන්දියාව තුළ ධාරිතා සංවර්ධනය සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සහයෝගීතාවය සඳහා මෙහෙයුම් රාමුවක් නිර්මාණය කිරීම සහ ඉන්දියාවේ යහපාලන පිළිවෙත් ශ්‍රී ලංකාව තුළ ද ක්‍රියාවට නැංවිය හැකි ආකාර පිළිබඳව මෙම සංචාරයේ දී මූලික අවධානය යොමු විය.

2. නියෝජිත පිරිස ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය අශෝක ප්‍රියන්ත මහතා හමු වූ අතර ජනාධිපති ලේකම් ඊ. එම්. එස්. බී. ඒකනායක මහතා සහ අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා සමඟ දීර්ඝ සාකච්ඡාවන්හි නිරත වූහ. නියෝජිත පිරිස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් ප්‍රදීප් යසරත්න මහතා ද හමු වූහ.

3. නියෝජිත පිරිස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) වෙත ගොස් එහි අධ්‍යක්ෂ ජෙනරාල් නාලක කළුවැව මහතා ප්‍රධාන අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය සමඟ කතාබහක නිරත වූ අතර එහිදී NCGG හි පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ පරිපාලන නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් ධනාත්මක අදහස් ද නියෝජිත පිරිස සමඟ බෙදා ගන්නා ලදී. DARPG හි ලේකම්තුමා SLIDA හිදී 'මධ්‍යගත මහජන දුක්ගැනවිලි විසඳීමේ පද්ධතිය: SMART රජයක් සඳහා පදනම' යන තේමාව යටතේ විශේෂ දේශනයක් ද සිදු කළ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්, SLIDA නිලධාරීන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය සහභාගී වූහ.

4. නියෝජිත පිරිස කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ද ගොස් දිස්ත්‍රික් ලේකම් ගිනිගේ ප්‍රසන්න ජනක කුමාර මහතා සහ වෙනත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ කතාබහක නිරත වී දත්ත එක්රැස් කිරීම, ලියාපදිංචි කිරීම, සමාජ සේවා, ආපදා

සහන, MSME සවිබලගැන්වීම, ඒකාබද්ධ මායිම් කළමනාකරණය වැනි විවිධ දෙපාර්තමේන්තු විසින් සපයනු ලබන සේවාවන් සඳහා යාන්ත්‍රණ සහ ආකෘතීන් පිළිබඳව අදහසක් ලබා ගත්හ.

5. ඉන්දීය නියෝජිත පිරිසේ තෙදින සංචාරය අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා ප්‍රමුඛ ඉහළ පෙළේ ශ්‍රී ලංකා නියෝජිත පිරිසක් විසින් 2024 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකා රාජ්‍ය සේවා නිලධාරීන් සඳහා ඉන්දියාවේ ධාරිතා සංවර්ධනය සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික සහයෝගීතාවය තවදුරටත් ශක්තිමත් කිරීම සෙයා බැලීම සඳහා සිදු කරන ලද සංචාරයකින් අනතුරුව සිදු වේ. ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍ය මට්ටමේ නිලධාරීන් සඳහා NCGG හිදී පිරිනැමෙන කෙටිකාලීන ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ නිලධාරීන් 100ක් පමණ මේ දක්වා සහභාගී වී ඇත. ඉන්දියානු නියෝජිත පිරිස විසින් සිදු කරන ලද මෙම සංචාරය අතරතුර සිදුකෙරුණු සවිස්තරාත්මක අන්තර්ක්‍රියාවන් ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා ඉන්දියාවේ යෝජිත ධාරිතා සංවර්ධන මුලපිරීම් වඩා වැඩි දියුණු කිරීමට සහ ඒවා ව්‍යුහගත කිරීමට උපකාරී වනු ඇත. මධ්‍යගත මහජන දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය, පරිපාලන ප්‍රතිසංස්කරණ, සේවක පරිපාලනය, විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ, ඊ - කාර්යාල, ප්‍රසම්පාදන ප්‍රතිසංස්කරණ යනාදිය ඇතුළු ශ්‍රී ලංකා පාර්ශ්වය විශේෂයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් නියෝජිත පිරිස අවධානය යොමු කළහ.

***

***කොළඹ***
***2024 ජූලි 12***